ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු මාලා අංක - 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට

පළමු කොටස : 83.00

	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
01	අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනවසර අල්ලාගැනීම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	අදාල ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිසි පරිදි පවත්වාගෙන යනු ලබයි.
02	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	මසක් ඇතුලත විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමට හැකිවන පරිදි නිලධාරීන් දැනුවත් කර ඇත.	විගණන විමසුම් බොහොමයකට නියමිත කාලය තුල පිළිතුරු සපයා ඇත. තවදුරටත් එය කඩිනම් කිරීමට කටයුතු කරමි.
03	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම කඩිනම් කිරීමට අවශ්‍ය පුහුණු හා දැනුවත් කිරීම් සිදුකරන ලදි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු බොහොමයක් නියමිත කාලය තුල ලැබී ඇත. තවදුරටත් කඩිනම් පිළිතුරු සැපයීමට ක්‍රියාකරමි.
04	විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර **4**ක් පවත්වා නොතිබුණි.	**2022** වර්ෂයේ පැවති අර්බුදකාරී තත්වය මත දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් **03**ක් පවත්වන ලදි. ප්‍රාදේශීය විගණන කළමනාකරණ කමිටු සියල්ල නිසි පරිදි පවත්වන ලදි.	ඉදිරි වර්ෂය සඳහා නියමිත පරිදි විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමට ක්‍රියාකරමි.
05	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට පියවර ගනිමින් සිටිමි.	සංචිත වාහන සියල්ලෙහි රාජ්‍ය ලාංඡනය පින්තාරුකර අවසන්ව ඇත.

	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
06	වාහනයක් ගර්හිත වී මාස **08** වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත වාහන වල ලියාපදිංචිය පිළිබඳ ගැටළු හා ලියාපදිංචි සහතික නොපැවතීම මත ප්‍රමාදයන් සිදුව ඇත. අදාල මූලික කටයුතු තවදුරටත් සිදුකරනු ලබයි.	ගර්හිත වාහන සම්බන්ධ චක්‍රලේඛ උපදෙස් පරිදි තක්සේරු කමිටු පත්කර ඉදිරි කටයුතු සිදුකරයි.
07	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	විසඳා නොමැති වාහන අනතුරු ගැටළු බොහොමයක් නිරාකරණය කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කර ඉදිරි කටයුතු සිදුකරයි.	පැවති වාහන අනතුරු ගොනු සම්බන්ධ මු.රෙ. ප්‍රකාරව කටයුතු කර ගොනු වසා දමන ලදි.
08	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	හිඟ ණය ශේෂ අයකර ගැනීමට චක්‍රලේඛ ප්‍රකාරව ගතහැකි සියළුම ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් දෙදෙනෙකුට එරෙහිව නඩු පවරා ඇති අතර **06** දෙනෙකුගෙන් ණය ශේෂ අයවෙමින් පවතී.
09	මු.රෙ. **371** ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින **10**ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගන්නා නිලධාරීන්ට කඩිනමින් පියවීම් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දී ඇත.	තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාදයකින් තොරව පියවීම් කටයුතු සිදුකරනු ලබයි.

<u>දෙවැනි කොටස : **68.00**</u>

01	මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	වියදම් අවම කිරීමේ අරමුණින් අවස්ථාවට ගැලපෙන පරිදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාගේ සහභාගිත්වයෙන් පවත්වනු ලබයි.	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සඳහා සභාපතිවරයා දින ලබාදීම සිදුකරන බැවින් එම දිනවල නියමිත පරිදි කමිටු පැවැත්වීම සිදුකරන ලදි. ඒ අනුව සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පරිදි වර්ෂය තුල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පවත්වා ඇත.
02	**1946** අංක **32** දරණ වාරිමාර්ග අඥා පණත අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	වර්ෂය තුල රටේ පැවති අර්බුධකාරී තත්වය මත දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු **07**ක් පවත්වා ඇත. නියමිත පරිදි දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු පැවැත්වීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි.	වර්තමානයේ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු නියමිත පරිදි පවත්වනු ලබයි.

	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
03	දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි.	පවතින රජයේ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන හිඟවීම හා නිවාස ඉල්ලීම් අවම වීම මත අවශ්‍ය පරිදි වර්ෂය තුල නිවාස කමිටු පවත්වන ලදි.	නිල නිවාස ඉල්ලීම් සලකා බලා අවශ්‍ය පරිදි නිවාස කමිටු පවත්වා ඇත.
04	දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	වර්ෂය තුල රටේ පැවති අර්බුධකාරී තත්වය මත අවස්ථානුකූලව පොහොර කමිටු පවත්වා ඇත.	පොහොර සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක නොවීම මත පොහොර කමිටු කන්නයකට අවශ්‍ය පරිදි පවත්වනු ලබයි.
05	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා අදාළ දර්ශක මේ වන විට සකස් කර ඇත.
06	ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	පුරවැසි ප්‍රඥප්තිය නැවත සකස් කරන ලෙස සියළුම කාර්යාල දැනුවත් කර දැනට ක්‍රියාත්මක තත්වයේ පවතී. ඇගයීම් කටයුතු සඳහා නිලධාරීන් පත්කර ඉදිරි කටයුතු සිදුකරමි.	කාර්යාල කිහිපයක් පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය යාවත්කාලීන කර ඇත. ඇගයීම් සිදුකර අවශ්‍ය වාර්තා ලබාගැනීමට කටයුතු කරමි.
07	සමස්ථ කාර්යමණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස්කර නොතිබුණි.	කාර්යසාධන ගිවිසුම් **2023** වර්ෂයට අදාලව සකස් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	**2024** වර්ෂයට අදාලව කාර්යසාධන ගිවිසුම් සකස්කර ඇත. **2023.11.30** දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **2/2018 (1)** ඡේදය මගින් මෙය සංශෝධනය කර ඇති අතර ඒ අනුව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දක්වා ඇත.
08	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	**2022** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යටත්ව මතයක් ලබා දී ඇත.	ඉදිරියේදී පැහැදිලි මතයක් ලබා ගැනීමට ක්‍රියා කරමි.
09	දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට **01** බැගින් රැස්වී නොතිබුණි.	මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරීන් මගින් දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු කාර්තුමය වශයෙන් හා ප්‍රාදේශීය කමිටු පැවැත්වීමට කටයුතු සිදු කරමි.	දැනට ප්‍රාදේශීය කමිටු පවත්වනු ලබයි. දිස්ත්‍රික් කමිටු පැවැත්වීමට කටයුතු කරමි.

	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම	ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
10	2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය මඟින් ආපදා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු යොදා ඇත.	2023 වර්ෂයේ ආපදා කළමනාකරණ කමිටු 09ක් පවත්වා ඇති අතර 2024 වර්ෂයේ ආපදා කළමනාකරණ කමිටු 07ක් පවත්වා ඇත.
11	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂයේ රටෙහි පැවති අර්බුදකාරී තත්ත්වය මත ඉන්ධන හා ප්‍රවාහන අපහසුතා නිසා ප්‍රගතිය අඩු මට්ටමක පැවතිණි. ඒ සඳහා දිස්ත්‍රික් පුහුණු අංශය දැනුවත් කර පුහුණු කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත.	ප්‍රාදේශිය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලබයි.
12	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ බොහෝමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කිරීම සාර්ථක මට්ටමක පවතී.
13	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	කරුණු දෙකක් පමණක් ඉතිරිව ඇත. හිඟ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධව නිරන්තරයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගෙන ඇත. නිල නිවාස සම්බන්ධයෙන් ගිණුම් කාරක සභාව දැනුවත් කිරීමට කටයුතු කරමි.	හිඟ ණය ශේෂ සම්බන්ධව වක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියා කරමි. නිල නිවාස සම්බන්ධ වර්තමාන තත්වය ගිණුම් කාරක සභාවට දැනුම් දී ඇත.
14	සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරිපත් නොකල නිලධාරීන්ට දැනුම් දී වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගෙන ඇත.	2024 වර්ෂයේ සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
15	දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 වරක් රැස් වී නොතිබුණි.	පරිසර නිලධාරීන් මාර්ගයෙන් පරිසර කමිටු පැවැත්වීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	පරිසර කමිටු පැවැත්වීමට කටයුතු කරමි.

.....

එච්.පී.සුමණසේකර,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

එච් පී සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට

.....

ජානක අමරරත්න,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට.

ජානක අමරරත්න
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
හම්බන්තොට.

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය